# ත්‍රිපිටක සාහිත්‍යය හා එහි ආකෘතිය පිළිබඳ කෙටි විමසුමක්

මාදිපොල විමලජෝති හිමි

## ප්‍රවේශය

බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ධර්මය"බුදුදහම, බුද්ධ වචනය, බුද්ධ ධර්මය" යන වචනවලින් හඳුන්වා ඇත. එසේම "ධම්ම, බ්‍රහ්මචරිය, ධම්මචක්ක, පාවචන, සාසන, සද්ධම්ම, තන්ති, සහිත, පාලි" යන වචනද බුද්ධ වචනය හැඳින්වීමට යොදාගෙන ඇත.අනතුරුව "ධම්ම - විනය" යන පොදු නාමයද බුද්ධ වචනය සඳහා ව්‍යවහාර විය. ඊටත් පසු "නවාංගසත්ථුසාසන" නමින්ද පසුව අද වර්තමානයේ දක්නට ලැබෙන "ත්‍රිපිටකය" යන නමින්ද බුද්ධ දේශනාව කොටස් වී ඇත. බුද්ධවචනය මෙසේ විවිධ වූ විභජනයන්ට හසු වූ අයුරු පාලි ත්‍රිපිටක සාහිත්‍යය, පාලි සාහිත්‍යය තුළින්ම දැකගත හැකිය.[1] අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමියන්ද සිය අට්ඨකථාවලදී බුද්ධ ධර්මය විවිධාකාරයෙන් කොටස් කර දක්වූහ. ඒ අනුව උන්වහන්සේ බුදුවදන හත් ආකාරයකට කොටස් කර ඇත.[2] "සියලුම බුද්ධවචනය රස වශයෙන් ඒක විධයි. ධර්ම-විනය වශයෙන් දෙපරිදිය. පඨම මජ්ඣිම පශ්චිම වශයෙන් ත්‍රිවිධයි. පිටක වශයෙන්ද එසේය. නිකාය වශයෙන් පංචවිධය. අංග වශයෙන් නව විධය. ධර්මස්කන්ධ වශයෙන් චතුරාසීති සහස්සවිධ යැයිද යනුවෙනි." බුද්ධ ධර්මය ලියා තිබෙන සාහිත්‍ය ත්‍රිපිටක සාහිත්‍ය වශයෙන් හඳුන්වනු ලබයි.[3] සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගත වූ තැන පවත්වන ලද ප්‍රථම ධර්ම මහා සංගීතියේදී සමස්ත බුද්ධ වචනය විනය, සූත්‍ර,



අභිධර්ම වශයෙන් පිටක තුනක් යටතේ සංගෘහීත වූ බව චුල්ලවග්ගපාළියේ පඤ්චසතිකක්ඛන්ධකයෙහි සඳහන් වේ.[4] අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමි පිටක යන්න විග්‍රහ කර ඇත්තේ මෙසේය. "පිටක" යන්නෙහි අර්ථ දන්නා අය පරියාප්ති ධර්මය යන අර්ථයෙන්ද, භාජනය යන අර්ථයෙන්ද පිටක යැයි කීහ. ඒ පිටක ශබ්දය සමග එක් කොට විනය, සූත්‍ර, අභිධර්ම යන තුනම දත යුතුය.[5] පිටක යන්නේ තේරුම "කූඩය" හෝ "වට්ටිය" යන්නයි. "සෙය්‍යතාපි භික්ඛවෙ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දල-පිටකං ආදය" (උදැල්ල හා කූඩය රැගෙන)[6] යන වචනය සූත්‍ර පිටකයේ දැකිය හැකිය. වෙන් වෙන් වශයෙන් බහා තැබූ භාජන වශයෙන් සලකා මෙහි මේ නාමය යොදන ලදැයි මහාචාර්ය පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝපවසති.[7]

ත්‍රිපිටකය එක් අවස්ථාවකදී දේශිතව නිමාවට පත්වූවක් නොවන බව බොහෝ උගතුන්ගේ මතය බව කේ.ආර්. නෝමන් පවසයි.[8] බුදුන්වහන්සේ ධරමාන සමයේ මෙබඳු බෙදීමක් නොවීය. සංගීතිකාරක මහ තෙරවරු එය සූත්‍ර, විනය, අභිධර්ම යැයි කොටස් තුනකට වර්ග කළහ. ත්‍රිපිටකය එකවරක සංග්‍රහ වී අවසන් වූවක්ද නොවන බව පැහැදිලිය. ප්‍රථම, දෙවන සංගීතිවල සංගායනා වූයේ ධර්ම හා විනයයි. එහෙයින්ම ප්‍රථම සංගීතියේදී ධර්මයත්, විනයත් චිරස්ථායීව පවිත්‍රව රැකගැනීම සඳහා මහාකාශ්‍යප ආදී මහතෙරවරු වෙසෙසින්ම කටයුතු කළහ.[9] ත්‍රිපිටකය සම්පූර්ණ වූයේ තෙවන ධර්ම සංගීතියේදී අභිධර්ම පිටකයට අයත් කථාවත්ථු ප්‍රකරණය රචනා කිරීමෙන් අනතුරුවයි. ඔල්ඩන්බර්ග්ත්‍රිපිටක බෙදීම ප්‍රකට වූයේ බුද්ධ භාෂිතය පිටක වශයෙන් බෙදා දක්වුණු අවස්ථා ද්වයක් ඉක්ම යෑමෙන් පසුව බව සඳහන් කරයි.

1. "ධම්ම" නමින් හැඳින් වූ "ඒකපිටක" අවස්ථාව.
2. ධම්මවිනය නොහොත් "සූත්‍ර හා විනය" නමින් හැඳින්වූ ද්විපිටක අවස්ථාවයි.

මේ අනුව අභිධර්මය ප්‍රථම සංගීති අවස්ථාවේ ප්‍රකටව නොතිබුණු බව චුල්ලවග්ගපාලියේ ප්‍රථම සංගීති ප්‍රවෘත්තියෙන්ම

පැහැදිලි වේ. ඒ අනුව සූත්‍ර, විනය, අභිධර්ම යන ත්‍රිපිටක භේදය ප්‍රකට වන්නේ තුන්වන ධර්ම සංගායනාවෙන් පසුවය. ත්‍රිපිටක සාහිත්‍යය යනු පුළුල් පරාසයක් ආවරණය කරන විෂයක්ෂේත්‍රකි. එහෙයින් මෙම සංක්ෂිප්ත ලිපියෙන් එකී සාහිත්‍යයේ අන්තර්ගතය පරීක්ෂා කරමින් ඒ ඒ පිටකයන්හි හා නිකායන්හි විශේෂත්වයන් මෙන්ම ආකෘතික ස්වභාවය යන කරුණුකෙටියෙන් අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරෙයි.

## විනය පිටකය

බුදුරජාණන් වහන්සේ මුල් විසිවසර තුළ දේශනා කළ ධර්මය හඳුන්වා ඇත්තේ "ධම්ම" යන නාමයෙනි. මුල් කාලය තුළ උන්වහන්සේට කිසිඳු විනය නීතියක් පැනවීමට අවශ්‍ය නොවූ බව මජ්ඣිමනිකායේ කකචූපම සූත්‍රයෙන්පැහැදිලි වේ. "**ආරාධයිංසු වත මෙ භික්ඛවෙ භික්ඛු එකං සමයං චිත්තං, නමෙ භික්ඛවෙ තෙසු භික්ඛුසු අනුසාසනී කරණීයා අහොසි. සතුප්පාදකරණීයමෙව මෙ භික්ඛවෙ තෙසු භික්ඛුසු අහොසි**"[10]

**භද්දලිය** සූත්‍රයේවිනය නොපැන වූ යුගයේ භික්ෂූන් ආචාරශීලීව විසූ බව සඳහන් වේ. මුල් කාලයේ හික්මවීම සඳහා ධර්මය දේශනා කළත් ඒවා හඳුන්වා ඇත්තේ "ධම්ම" යනුවෙනි. "**අහං හි බ්‍රාහ්මණ විනයාය ධම්මං දෙසෙමි**"[11] විනය පිටකය පළමුවෙන්ම දක්වා ඇත්තේ ප්‍රථම සංගීති අවස්ථාවේදී "**විනයො නාම බුද්ධ සාසනස්ස ආයු විනයෙ ඨිතෙ සාසනං ඨිතං හොති. තස්මා පඨමං විනයං සංගායෙය්‍යාම**"[12] යන අටුවා පාඨයට අනුව විනය ප්‍රථමයෙන්ම සංගායනා වූ බව කියන හෙයිනි. එහිදී විනය පිටකය පවත්වාගෙන යෑමට උපාලි හිමි ඇතුළු පිරිසට භාරවිය.

විනය යන්න අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමියන් විග්‍රහ කර ඇත්තේ මෙසේය. "අනේක විධ වූ විශේෂ නය ඇති බැවින්ද, කාය වාග් දෙක හික්මවන බැවින්ද, විනයාර්ථ දන්නවුන් විසින් විනය විනය යැයි පවසන ලදී"[13] කායවාග් ද්වාරයන් මනාකොට හික්මවන නොයෙක් ප්‍රකාර විශේෂ නය ක්‍රමයක් ඇති ධර්ම කොට්ඨාසයට විනය යැයි කියනු ලැබේ. එනම්, විනය පිටක යයි.



විනය පිටකයේ ප්‍රධාන වශයෙන් විස්තර කරනු ලබන්නේ ප්‍රාතිමෝක්ෂයේ ඇතුළත් දෙසිය විසිහතක් පමණ වූ ශික්ෂා පදයි. ඒවා පැනවීමට හේතු වූ නිදාන කථාවන් හා ශික්ෂාපදවල නියම තේරුම දැන ගැනීම සඳහා දී තිබෙන විවරණයන් නිසා ඒ පොත් විශාල වී ඇති බව බුද්ධදත්ත හිමියෝ පවසති. ප්‍රථම සංගීති කාරක මහ රහතන්වහන්සේලා විසින් විනය පිටකය මුල දී බෙදන ලද්දේ,

1. උභතොවිභංග (සුත්තවිභංග) - පරාජිකා පාලි, පාචිත්තිය පාලි[14]
2. ඛන්ධක - මහාවග්ග පාලි, චුල්ලවග්ග පාලි
3. පරිවාර - පරිවාරය[15]

මෙසේ මුලදී උභතො විභංග, ඛන්ධක, පරිවාර වශයෙන් සංගෘහීත වූ විනය පිටකය ග්‍රන්ථාරූඪ සංගීතියේදී පාරාජිකා පාලි, පාචිත්තිය පාලි, මහාවග්ග පාලි, චුල්ලවග්ග පාලි, පරිවාර පාලි වශයෙන් පොත් පහකට බෙදන ලදි.

සමාන්තපාසාදිකව, සුමංගලවිලාසිනි, අත්ථසාලිනි වැනි අටුවා ග්‍රන්ථවල නිර්වචන අනුව උභය ප්‍රාතිමෝකෂයක්ද ඇති බව පෙනේ. "**කතමං විනය පිටකං? පඨම සංගීතියං සංගීතඤ්ච අසංගීතඤ්ච සබ්බම්පි සමොධානෙත්වා උභයානි ප්‍රාතිමොක්ඛානි, ද්වෙවිභංගා, ද්වාවීසති ඛන්ධකා සොළස පරිවාරා ඉධං විනය පිටකං නාම**"[16] මෙහි සඳහන් ආකාරයට ප්‍රථම සංගීතියේ දී සංගායනා වූ මෙන්ම නොවූ සියල්ල විනය පිටකයෙහි ලා සලකා ඇති බව පෙනේ. ඒ අනුව පැන නඟින ගැටලුව වන්නේ ප්‍රථම සංගීතියේදී සංගායනා නොවූයේ කුමක්ද යන්නයි. සාරත්ථදීපනී ටීකාවේ සඳහන් වන්නේ චුල්ලවග්ගපාලියේ එන පඤ්චසතිකක්ඛන්ධකය හා සත්තසතිකක්ඛන්ධකයත්, කථාවත්ථුව හා සුභ සූත්‍රයත් එසේ සංගායනා නොවූ කොටස් බවයි.[17] වර්තමානයෙහි පවත්නා භික්ෂු භික්ෂුණී උභය ප්‍රාතිමෝක්ෂය විනය පිටකයෙහි ලා සංග්‍රහ

වී නොමැත. එහෙත් සමන්තපාසාදිකාව පෙන්වා දෙන්නේ භික්ෂුණීන් සඳහා භික්ඛුණී විභංග නමින් ශික්ෂාපද සංග්‍රහයක්ද භික්ෂූන් සඳහා භික්ඛු විභංග නමින් සංග්‍රහයක්ද සංගායනා වූ බවයි.[18] අද දක්නට ලැබෙන විනය පිටකය තුළ මෙනමින් ග්‍රන්ථ දෙකක් දක්නට නැත. මෙහි ඇතුළත් වී ඇති කොටස් භික්ඛු භික්ඛුණී විභංග යන නාමය යටතේ හැඳින්වෙන පාරාජිකා හා පාචිත්‍ය කොටස් දෙකේ ඇතුළත් වී ඇත. මහාවිභංගය නමින් සියලු ශික්ෂා පද ඇතුළත් ග්‍රන්ථයක් පළමු සංගායනාවේදී සංගායිත බව සමන්තපාසාදිකව සඳහන් කරයි.[19]

කේ.ආර්. නෝමන් මහතාගේ පර්යේෂණයන්ට වඩාත් භාජනය වී ඇත්තේ විනය පිටකයයි. ඔහුගේ අදහසට අනුව විනය පිටකය තරම් සංස්කරණයන්ට භාජනය වූ වෙනත් කිසිඳු ග්‍රන්ථයක් නොමැත. විනයෙහි එන ඇතැම් කථා පුවත් ජාතක කථාවන්හිද, අපදානයෙහිද දක්නට ඇත. අංගුත්තරනිකායේ සඳහන්වන මහමුහුදෙහි ආශ්චර්යමත් අංග අට චුල්ලවග්ගයේ සඳහන්වීමෙන්මනෝමන් මහතාගේ ප්‍රකාශනයේ සත්‍යතාවක් ඇතැයි හැඟේ. එසේම චුල්ලවග්ගපාලියේ එන ඇතැම් විස්තර විනය සම්බන්ධයෙන් නම්‍යතාවක් දක්නට නොලැබෙන බවද ඔහුගේ මතයයි.[20]

උභතො විභංගය සකස් වී ඇත්තේ ශික්ෂාපද පැනවීමට හේතුව, ශික්ෂාපද කඩ කිරීමේදී විඳිය යුතු දඬුවම, වචනයක් පාසා කරන අර්ථවිවරණය, ශික්ෂාපදය කඩකිරීමේදී එහි සඳහන් පරිදි කටයුතු නොකළ අවස්ථා පිළිබඳව විස්තර කරන කරුණු අනුවය.

**භික්ඛු විභංගයෙහි කොටස් අටකි :**

පාරාජිකා 4, සංඝාදිසෙස 13, අනියත 2, නිසඟි පචිති 30, පචිති 92, පාටිදෙසනීය 4, සේඛියා 75, අධිකරණ සමථ 7, සියල්ල 227 ක් වශයෙනි.



**භික්ෂුණී විභංගයෙහි :**

පාරාජිකා 8, සංඝාදිසෙස 17, නිසඟි පචිති 30, පචිති 166, පාටිදෙසනීය 8, සේඛියා 75, අධිකරණ සමථ 7, සියල්ල 311 ක් වශයෙනි.

උභතොවිභංගයට අයත් පාරාජිකාවලින් එකක් හෝ කඩකළහොත් ඒ භික්ෂුවගේ භික්ෂු භාවය අහෝසි වෙයි. සංඝාදිසෙස කඩකළහොත් සංඝයා ඉදිරිපිට දී වත් මානත් සමාදන් වී නියමිත දිනගණනක් වත් මානත් පුරා සංඝයා ඉදිරි පිටට පැමිණ අබ්භාන කර්මයෙන් පිරිසිදු බව ලබා ගත යුතුය. මේ ආකාරයට ඒ ඒ වැරදිවල ස්වභාවය අනුව ඒ සඳහා දිය යුතු දඬුවමද විනයෙහි දක්නට ලැබේ. උභතො විභංගය වැඩී ඇති වූයේ ප්‍රාතිමෝක්ෂය මතය. එහෙත් ප්‍රාතිමෝක්ෂයද වැඩී ඇති වූවකි. ප්‍රාතිමෝක්ෂයේ සඳහන් ශික්ෂාපද සියල්ල බුද්ධකාලයේදීම සංග්‍රහ වී තිබුණා යැයි සිතිය නොහැකිය. ඒ බව අංගුත්තරනිකායේ නවක නිපාතයේ ශික්ෂාපද 150කින් යුත් ප්‍රාතිමෝක්ෂයක් ගැන කියවීමෙන් පැහැදිලි වේ.[21] එහෙයින් දැනට ඇති ප්‍රාතිමෝක්ෂයද පසුව වැඩී ඇති වූවකැයි සිතිය හැකිය. ප්‍රාතිමෝක්ෂයට පසුකාලයේ දී අටුවාවක්ද එකතු විය. ඒ අටුවාවෙන් ශික්ෂාපද ගැන තවත් විස්තරයක් කරයි. පසුව විශාල වූ ප්‍රාතිමෝක්ෂයට ශික්ෂාපදයන් පිළිබඳ ඓතිහාසික කරුණුද එක් විය. ශික්ෂාපදය පැනවීමට හේතු වූ කාරණය, ස්ථානය, පුද්ගලයා ආපත්තිය ආදි කරුණු මෙයට ඇතුළත් වී ඇත. මෙසේ ක්‍රමයෙන් වැඩී අටුවාවකින්ද, ඓතිහාසික හැඳින්වීමකින්ද යුත් ප්‍රාතිමෝක්ෂය සුත්තවිභංගයේ ස්වරූපය ගත්තේය. ක්‍රමයෙන් වැඩී සම්පූර්ණ වූ නමුත් උභතොවිභංගය විනය පිටකයේ පැරණිම ග්‍රන්ථය වෙයි.[22]

ඛන්ධක 10කින් යුත් මහාවග්ගයද, ඛන්ධක 12කින් යුත් චුල්ලවග්ගයද විනය පිටකයෙහි පැරණි ග්‍රන්ථ වේ. මේ ඛන්ධක විසි දෙකෙහි බුද්ධ ශාසනයෙහි ඓතිහාසික සංවර්ධනය බුද්ධත්වය ලැබූ තැන් පටන් ද්විතීය සංගීතිය තෙක් කරුණු විස්තර වේ. උභතොවිභංගය ප්‍රාතිමෝක්ෂය ඇසුරු කොට ඇති

වූවක් මෙන්ම ඛන්ධක ඇති වූයේ කම්මවාචා යන පාඨ ඇසුරු කොටගෙන බව පෙනේ. උභතො විභංගයේ මුල් අවස්ථාවේ පැන වූ ශික්ෂාපද සඳහන්වන අතර ඛන්ධකයන්හි එහි ව්‍යාප්තිය පිළිබඳ විස්තර සඳහන් වේ. මහාවග්ගයේ ප්‍රාතිමෝක්ෂය දෙසීම පිළිබඳ උපදෙස් දැකිය හැකි හෙයින් මහාවග්ග චුල්ලවග්ග දෙක ප්‍රාතිමෝක්ෂයට පසුව ඇති වූවක් බව සිතිය හැකිය. ප්‍රාතිමොක්ෂයේ පැරණිකම **"තෙන ඛො පන සමයෙන භික්ඛු දෙවසිකං ප්‍රාතිමොක්ඛං උද්දිසන්ති"** යනාදි පාඨවලින් පෙනේ.

විනය පිටකයෙහි අවසාන ග්‍රන්ථය වන පරිවාරපාලිය බොහොසෙයින් සංස්කරණයන්ට භාජනය වූවක් බව පැහැදිලිය. මෙය විනය පිටකයට කළ ප්‍රස්තාවනාවක් බඳුය. අටුවාව විස්තර කරන පරිවාරයට වඩා වර්තමානයේ දක්නට ලැබෙන පරිවාරය වඩාත් විශාල වූවක් වේ. පරිවාරපාලියේ මුල් පරිච්ඡේදයේ අවසානයේ **"භික්ඛු විභංගෙ සොළස මහාපරිවාරා නිට්ඨිතා"**[23] යනුවෙන්ද දෙවන පරිච්ඡේදය අවසානයේ **"භික්ඛුණී විභංගෙ සොළස මහාපරිවාරා නිට්ඨිතා"**[24] යනුවෙන්ද සඳහන් වී ඇති අතර වර්තමානයේ මීට වඩා වැඩි කොටසක් පරිවාරයේ අන්තර්ගත වී ඇත. දෙවන පරිච්ඡේදයෙන් පසුව එන අනෙකුත් කොටස්වල එන භාෂා ලක්ෂණද ත්‍රිපිටකගත අනෙකුත් කොටස්වල එන භාෂා ලක්ෂණවලට වඩා වෙනස් බව පෙනේ. මෙහි රචනා ශෛලියේ ප්‍රශ්නෝත්තර ක්‍රමයක් දිස්වේ. එහෙයින් බොහෝ විචාරකයින්ගේ මතය වී ඇත්තේ මෙය ලංකාවේ දී සංස්කරණය වන්නට ඇති බවයි. ඊට හේතු වශයෙන් මෙහි තම්බපණ්ණිය පිළිබඳව සඳහන්වීම, ත්‍රිපිටක ග්‍රන්ථාරූඪය දක්වා තෙරවරුන්ගේ නම් සඳහන් වීම, මහින්ද හිමියන් ප්‍රමුඛ ධර්ම දූත පිරිස පිළිබඳව විස්තර දක්නට ලැබීම ආදි සාධක ඒ සඳහා දක්වා ඇත. මෙය දීප නම් තෙර නමක් ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනය සඳහා කරන ලද බව බී.සී. ලෝ මහතා ප්‍රකාශ කරයි.[25] මේ ආදි කරුණු පදනම් කරගෙන පරිවාරය පශ්චාත් කාලීන ග්‍රන්ථයක් යැයි කීමට බොහෝ විචාරකයෝ පෙළඹෙති.[26]



## සුත්ත පිටකය

සුත්ත යන පාලි පදයේ සංස්කෘත රූපය සූත්‍ර යන්නයි. එය ප්‍රාග් බෞද්ධ යුගයේද ව්‍යවහාර විය. සුත්ත යන්නෙන් මුල් අවස්ථාවේ දී අදහස් කර ඇත්තේ අර්ථවත් කෙටි ප්‍රකාශනයක් බව සූත්‍ර නාමයෙන් හඳුන්වා ඇති පැරණි ත්‍රිපිටක කොටස් පරීක්ෂා කිරීමෙන් පැහැදිලි කරගත හැකිය. ප්‍රාතිමෝක්ෂයත්, ශික්ෂාපදත් හඳුන්වා ඇත්තේ සුත්ත නාමයෙනි. අභිධර්මය සඳහාත් සුත්ත යන්න යෙදී තිබූ බව ත්‍රිපිටක සාහිත්‍යයේ සඳහන් වේ. මාතිකා යන්නෙන් අදහස් වූයේ විනය ශික්ෂාත් අභිධර්ම මාතෘකාත්ය. බුද්ධ ධර්මය සම්බන්ධයෙන් සලකා බලන විට කෙටි අර්ථවත් ප්‍රකාශන ගණයෙහිලා ගැනෙන්නේ ඉහත කී කොටස්ය. එසේ වුවහොත් සුත්ත,මාතිකා යන ශබ්දද්වයෙන් මුල් අවස්ථාවේදී ගම්‍යමාන වන්නට ඇත්තේ සමානාර්ථයක් විය යුතු බව මහාචාර්ය ඔලිවර් අබේනායක පවසයි.[27] අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ හිමියන් සුත්ත යන්න හඳුන්වා ඇත්තේ මෙසේය.[28]

1. අරුත් දක්වන බැවින්
2. මැනවින් කියන ලද බැවින්
3. අසන බැවින්
4. පැසවන බැවින්
5. සූත්‍රයන්ට නූලක් වැනි බැවින් සූත්‍රයන්ට සූත්‍ර යැයි කියන ලදි.

මෙම අර්ථකතනය සමන්තපාසාදිකාව, සුමංගලවිලාසිනිය, අත්ථසාලිනිආදි බුද්ධඝෝෂ හිමියන්ගේ අටුවා තුනෙහිම සඳහන්වේ. සුත්තනිපාත අට්ඨකථාවේ සුත්ත ශබ්දය විස්තර කර ඇත්තේ මෙසේය. "සුත්ත යනු නූලට නමකි. නූලක් මෙන් පිළිවෙල නොසිඳ පැවතෙන හෙයින්ද සුත්ත නම් වේ. නූලකින් අමුණන ලද පුෂ්පයෝ යම් සේ නොවිසිරෙත්ද එසේ සංග්‍රහ කරන ලද හෙයින් සුත්ත නම් වේ"[29] යනුවෙනි. සුත්ත නාමය මුල් අවස්ථාවේදී ගද්‍ය ප්‍රකාශයක් වූ බව පැහැදිලි වේ.

චුල්ලවග්ගපාලියේ පඤ්චසතිකක්ඛන්ධකයේ සුත්ත හෝ සුත්තපිටක යන ව්‍යවහාරයක් දක්නට නොමැත. එහි වර්තමාන සූත්‍ර පිටකය සංග්‍රහ කර ඇත්තේ "ධම්ම" නාමය යටතේය. මේ අනුව පළමු සංගීතියේදී සංගායනා වූයේ ධර්ම පිටකයයි. මෙම ධර්ම පිටකය කොටස් පහකින් යුක්තය. එහෙත් ඛුද්දක නිකාය සම්පූර්ණ වූයේ ප්‍රථම සංගීතියද ඉක්ම ගිය පසුය. එහෙයින් නිකාය පඤ්චකය ප්‍රකට වූයේ ධර්ම පිටකයට පර්යායව සූත්‍ර පිටක යන ව්‍යවහාරය ඇතිවීමෙන් පසුවය.[30]

සූත්‍ර පිටකය අනික් පිටක දෙකට වඩා බොහෝ කරුණු අතින් වැදගත් යැයි උගතුන්ගේ පිළිගැනීමයි. ත්‍රිපිටක අනුපිළිවෙළෙහි මූලිකත්වය ලැබී තිබුනේ සූත්‍ර පිටකයටය. විනය මූලිකත්වයට පත්වූයේ පසුව ඇති වූ ඓතිහාසිකත්වය යටතේය. "විනයො නාම බුද්ධ සාසනස්ස ආයු, විනයෙ ඨිතෙ සාසනං ඨිතං හොති. තස්මා පඨමං විනයං සංගායෙය්‍යාම"[31]

ඒ අනුව සූත්‍ර පිටකයේ සුවිශේෂත්වයට හේතුවන කරුණු කිහිපයක් මෙසේවිමසා බැලිය හැකිය.

1. බුදුන්වහන්සේගේ ගවේෂණය සම්පූර්ණයෙන් සංග්‍රහ වී ඇත්තේ සූත්‍ර පිටකයේය
2. බුදුසමයේ දර්ශනික හා ආගමික හරය සංග්‍රහ වී තිබීම
3. ත්‍රිපිටකයට අයත් පැරණි දේශනා දැකිය හැකිවීම
4. බුදුරජාණන් වහන්සේ දෙසූ දහම්වලින් වැඩි කොටසක් සංග්‍රහ වී තිබීම
5. සූත්‍ර පිටකයේ අගය රැදී ඇත්තේ බුද්ධ ධර්මයේ සුවිශේෂ පනිවිඩය පරිපූර්ණව සටහන් වීම තුළිනි
6. බුදුරජාණන් වහන්සේගේ විශේෂත්වයත්ණ ශාස්තෲවරයෙකු වශයෙන් උන්වහන්සේගේ කාර්යය සාඵල්‍යයත් දත හැක්කේ සූත්‍රපිටකය අනුසාරයෙනි
7. ඥාන ගවේෂණයට අවශ්‍ය කාරණා බොහෝමයක් ලද හැකිවීම



8. විනය, අභිධර්ම පිටක සංවර්ධනයවීමේදී නො අඩු ආභාසයක් ලැබී තිබීම
9. බුදුදහම සොයන්නවුන්ගේ වැඩි අවධානයට ලක්වන්නේ සූත්‍ර පිටකයයි
10. බුදුන්වහන්සේගේ කාලයේ සමාජ, ඓතිහාසික, ආර්ථික, දේශපාලනික ආගමික තොරතුරු සටහන් වී තිබීම ආදි කරුණු රැසක් නිසා සූත්‍ර පිටකය සුවිශේෂත්වයක් උසුලයි

සූත්‍ර පිටකය කොටස් පහකින් සංග්‍රහ වූවක් බව අටුවාවන්හි සඳහන්වේ. දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුක්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්ධක නිකාය[32] වශයෙනි. මෙම ග්‍රන්ථ එකම වකවානුවක එක්වර සංග්‍රහ වූ ධර්ම පරියායන් නොවේ. මෙවැනි බෙදුම් ක්‍රමයක් බුදුන් දවසද නොවීය. මෙහි නිකාය යන්නෙහි තේරුම "සමූහය" යන්නයි.

සූත්‍ර පිටකයේ ස්වභාවය පිළිබඳ උගතුන්ගේ මතය වන්නේණි දීඝනිකාය, මජ්ඣිම නිකාය යන නිකාය දෙකට වඩා සංයුත්ත, අංගුත්තර නිකායන් සැකසී ඇති ආකාරය ක්‍රමවත් බවයි. එම නිකාය ග්‍රන්ථයන්හි කරුණු ගොනු කර ඇති ආකාරය මේ සඳහා පාදක වී ඇත.

## දීඝ නිකාය

දීඝනිකායේ නාම මාත්‍රය අනුව සැලකුවහොත් ඉතා දීර්ඝ සූත්‍ර ඇති හෙයින් මේ නාමය යෙදී තිබෙන බව අටුවාචාර්යවරු පවසති.[33] එහෙත් මජ්ඣිම නිකායේද දීඝනිකායේ සූත්‍රවලට වඩා දීර්ඝ සූත්‍ර ඇත. එහෙයින් දීඝනිකාය හා මජ්ඣිමනිකාය යන නිකායවල දක්නට ලැබෙන මෙම ලක්ෂණ සෙසු නිකායන් වර්ග කිරීමේදී නොපෙනෙන බව උගතුන් පෙන්වා දෙනු ලබයි. මෙය ප්‍රථම සංගීතියේදී සංගායනා කර ආනන්ද හිමියන්ට පවරන ලදී. මෙහි වර්ග තුනකි. සූත්‍ර 34කි.

1. සීලක්ඛන්ධ වග්ගය - බ්‍රහ්මජාලා ආදී සූත්‍ර 13කි.
2. මහාවග්ගය - මහාපදන ආදී සූත්‍ර 10කි.

3. පාටිකවග්ගය - පාටික ආදී සූත්‍ර 11කි.

බුදුදහමේ ඉතා ගැඹුරු දහම් කොටස් මෙහි ඇතුළත් වන අතර බ්‍රාහ්මණ ධර්ම, ෂට් ශාස්තෘවරු හා ධර්ම, දෙසැටක් මිත්‍යාදෘෂ්ටි, බුදු දහමේ සීල, සමාධි, ප්‍රඥා ධර්ම, දෙතිස් මහා පුරුෂ ලක්ෂණ, සමථ විදර්ශනා භාවනා ආදි ධර්ම කරුණුද විස්තර වේ.

දීඝනිකායේ බ්‍රහ්මජාල,සාමඤ්ඤඵල සූත්‍ර ඉපැරණි සූත්‍රයන්ය. ඒ බව විනය පිටකයේ චුල්ලවග්ගයේ මෙම සූත්‍ර දෙක ගැන සඳහන් වීමෙන්පැහැදිලි වේ. එහෙයින් බී.සී. ලෝ මහතා දීඝනිකායේ සීලක්ඛන්ධවග්ගය උක්ත සූත්‍ර විනයෙහි සඳහන්වන කාලය වන විට සංග්‍රහ වී තිබෙන්නට ඇතැයි ප්‍රකාශ කරයි. මහාවග්ගය හා පාථිකවග්ගය ඊට පසුව එකතු වූ ඒවාසේ සැළකෙයි. පායාසිරාජඤ්ඤ සූත්‍රය බුද්ධ පරිනිර්වාණයෙන් වසර පනහක් පමණ ගත වූ පසු රචනා වූවකැයි රීස්ඩෙවිඩ්ස් මහතා පවසයි.[34] පාථිකවග්ගයේ අටානාටිය සූත්‍රය ආරක්ෂක මන්ත්‍ර ස්වරූපයක් ගනියි. එය පසුව එකතු වූවක් බව නිසැකය. මහාපරිනිබ්බාන සූත්‍රය වරින්වර කොටස් එකතු වීමෙන් සංගෘහීත වූවක්සේ සැළකෙයි. මහාපරිනිබ්බාන සූත්‍රයේ අගට යොදු ඇති ගාථා ලංකාවේදී එකතු වූ බව බුද්ධඝෝෂ හිමියන් පවසයි. මජ්ඣිමනිකාය දීඝනිකායට වඩා පැරණි යැයි සලකන්නේ එහෙයිනි. දීඝනිකායේ මහා යන විශේෂය ඇති සූත්‍ර ඇත්තේ මහාවග්ගයේ පමණි. එහෙත් ඒවා මජ්ඣිමනිකායේ සඳහන් යුග්ම සූත්‍ර නොවේ.

ඔටෝප්‍රැන්ක් නම් ජර්මන් පඬිවරයා බුදුන්වහන්සේ විසින් සත්ත්වයාගේ යහපත හා විමුක්තිය ඇති කර ගැනීමට මඟ පෙන්වූ දේශනා ක්‍රමිකව හැඩගැසුනු සූත්‍ර ඇතුළත් වී ඇති හෙයින් දීඝනිකාය පමණක් සජාතීය යැයි පැවසීය. එහෙත් අනෙක් නිකායවලද මෙම ලක්ෂණ ඇති හෙයින් දීඝනිකායේ සූත්‍ර පමණක් සජාතීය යැයි කිව නොහැකි බව වින්ටර්නිට්ස් පවසයි. දීඝනිකායේ සූත්‍රවල දැකිය හැකි සාධාරණ ලක්ෂණය නම් සූත්‍රවල දීර්ඝත්වය පමණි. එහෙත් මජ්ඣිමනිකායේ සූත්‍ර හා සැසඳීමේදී එසේ සිතීමටද අපහසුය. ඒ අනුව දීඝනිකායේ සූත්‍රවල



විවිධත්වය කොතෙකුත් දැකිය හැකිය. ඒ සඳහා කරුණු කිහිපයක් පහතාකාරයට දැක්විය හැකියි

1. බ්‍රාහ්මජාල සූත්‍රයේ කරුණු එකිනෙකට වෙනස් ස්භාවයක් තිබීම
2. සාමඤ්ඤඵල සූත්‍රයේ ෂට්ශාස්තෘවරුන්ගේ මතත් බුදුරජාණන් වහන්සේගේ මතත් විස්තර වීම
3. මහාපරිනිබ්බාන සූත්‍රයේ බුදුරජාණන් වහන්සේගේ අවසාන කාලයේ තතු හෙළි කිරීම
4. සූත්‍ර වර්ග කර තිබෙන ආකාරයද සජාතීය බවක් නො හඟවයි

   උදා:- සීලය කාරණා කොටගෙන සීලක්ඛන්ධවග්ගය යැයි නම් කරයි.මහා යන විශේෂණය අනුව මහාවග්ගය වෙන් කර ඇත. එහෙත් මහාවග්ගයේ මහා යන විශේෂණ නැති සූත්‍ර තුනක් දැකගත හැකිය. එනම්, ජනවසභ, සක්කපඤ්හ, පයාසි යන සූත්‍රයන්ය. පාථිකවග්ගය නම් කර ඇත්තේ මුලින් දැක්වෙන සූත්‍රයක නාම මාත්‍රය සලකාගෙනය. (පාථික සුත්ත)

සීලක්ඛන්ධවග්ගය ගද්‍යයය. මහාවග්ග, පාථිකවග්ග දෙක ගද්‍ය පද්‍ය මිශ්‍රය. එහෙයින් මෙසේ විවිධත්වයක් දීඝනිකායේ සූත්‍රවල ඇති හෙයින් එය සජාතීය ලක්ෂණවලින් සමුපේත බව කිසිසේත් කිව නොහැකි බව උගතුන්ගේ මතයයි. මෙම නිකායේ ශ්‍රාවක භාෂිත සූත්‍ර පහක් ඇත.

අනඳ හිමි - සුභ සූත්‍රය

කුමාරකාශ්‍යප හිමි - පයාසිරාජඤ්ඤ සූත්‍රය

සැරියුත් හිමි - සම්පසාදිනීය, සංගීති, දසුත්තර සූත්‍ර

අටානාටිය සූත්‍රය සිව්වරම් දෙවිවරුන් විසින් සම්පාදනය කරන ලදුව බුදුරදුන් පසුව අනුදත් සූත්‍රයකි. එහෙයින් එය දේවභාෂිතයක් හැටියට පිළි නොගත හැකි බව විචාරක මතයයි.

දීඝනිකායේ ඇතැම් සූත්‍ර ගාථා රහිතය. බ්‍රාහ්මජාල සූත්‍රය ඊට කදිම නිදසුනකි. ගාථා රහිතවීම වෙය්‍යාකරණයේ ලක්ෂණයකි. "වෙය්‍යාකරණෙ ඉමස්මිං නිග්ගාතකෙ සුත්තෙ" මේ අනුව බ්‍රාහ්මජාල සූත්‍රය වෙය්‍යාකරණයෙකි.

## මජ්ඣිම නිකාය

මෙය මුළු ත්‍රිපිටකයටම අයත් කරුණු එක් රැස් කර කළ ප්‍රස්තාවනාවක් බඳුය. මජ්ඣිම ප්‍රමාණයේ සූත්‍ර ඇතුළත් නිසා මේ ග්‍රන්ථයට මජ්ඣිම නිකාය යැයි ව්‍යවහාර කරයි.[35] මෙය ප්‍රථම සංගීතියේදී සංගායනා කර සැරියුත් හිමියන්ගේ ශිෂ්‍ය පිරිසට පවරන ලදී. නිකාය ග්‍රන්ථයන් අතුරින් මජ්ඣිමනිකාය වඩා පැරණි බව බොහෝ උගතුන්ගේ පිළිගැනීමයි. එහෙත් සෑම නිකායකම ඉපැරණි හා පශ්චාත් කාලීන සූත්‍ර දකගත හැකිය. බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයක පමණ කාලයේදී මජ්ඣිමනිකාය සම්පූර්ණ වූ බව විචාරක පිළිගැනීමයි. මජ්ඣිම නිකායේ ඇති විශේෂ ලක්ෂණ මෙසේය.

1. නිකාය ග්‍රන්ථවල චූල මහා වශයෙන් යුග්ම සූත්‍ර දත හැකිය. එබඳු සූත්‍ර බහුලව දකිය හැක්කේ මජ්ඣිමනිකායේය.

   චූලසීහනාද, මහාසීහනාද
   චුල්ලහත්ථිපදෙපම, මහාහත්ථිපදොපම
   චූලසච්චක, මහාසච්චක

2. ඇතැම්විට චූල මහා විශේෂණ පද මාරුවීද යෙදී ඇත.

   මහාදුක්ඛක්ඛන්ධ, චූලදුක්ඛක්ඛන්ධ
   මහාසාරෝපම, චූලසාරෝපම

3. මජ්ඣිමනිකායේ යුග්ම සූත්‍රවලදී එක සූත්‍රයක අදහස අනික් සූත්‍රයේ අදහස සංක්ෂිප්ත කර දක්වන සූත්‍රද, එසේ නොවන සූත්‍රද දකගත හැකිය. මහාවේදල්ල සූත්‍රය - මහාකොට්ඨිත තෙරුන් සැරියුත් හිමියන්ගෙන් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු අඩංගුකොට නිම වූවකි. චූලවේදල්ල



සූත්‍රය - ධම්මදින්නා භික්ෂුණියගෙන් විසාක උපාසකයා ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු සපයන සූත්‍රයකි. චූලසච්චක සූත්‍රය - බුදුරජාණන් වහන්සේ හා සච්චක අතර ඇති වූ වාදයක් දක්වේ. මහාසච්චක සූත්‍රය - කාය භාවනාව හා චිත්ත භාවනාව පිළිබඳ විමසූ සච්චකට බුද්ධත්වයට පැමිණි අයුරු විස්තර කර ඇත.

4. චූල හා මහා යන විශේෂණ නම්වලින් හැඳින්වූ ඇතැම් සූත්‍ර සූත්‍රාගත ධර්ම කරුණු හා සමානය. මේ සඳහා නිදසුන් ලෙස, මහාදුක්ඛක්ඛන්ධ, චූලදුක්ඛක්ඛන්ධ සූත්‍ර දෙකෙහි කාමරූප වේදනාවන්ගේ ආශ්වාදයේ නිස්සාරත්වය දක්වීම පෙන්වාදිය හැකිය. මේ අනුව ඇතැම් සූත්‍රාගත කරුණු සමාන හා අසමානතාවක් දක්වන බවද කිව යුතුය.

5. බුදුරජාණන් වහන්සේ අනුමත නොකළ සූත්‍රද මජ්ඣිමනිකායේ ඇත. බ්‍රාහ්මණ වග්ගයේ ඝොටමුඛ සූත්‍රය, බුද්ධපරිනිර්වාණයෙන් පසු උදේන තෙරුන් තේමිය නම් අඹ වනයේදී ඝෝඨමුඛ නම් බමුණාට දෙසන ලද්දකි. දෙවදහවග්ගයේ ගොපකමොග්ගල්ලාන, සුඤ්ඤතවග්ගයේ බක්කුල ආදි සූත්‍රද අර්වාචීන බව පැහැදිලිය. බක්කුල සූත්‍රය දෙවැනි සංගීතියෙන් පසු මැදුම් සගියට එක්වූවක්සේ අටුවාවන්හි සඳහන් වේ. මේවා අනුමත කිරීමට බුදුරදුන් නොසිටි බැවින් සංගීති කාරක තෙරවරු එම සූත්‍රයන්හි වැදගත්කම සලකා නිකාය ග්‍රන්ථවලට ඇතුළු කරන්නට ඇත.

6. මීට අමතරව මජ්ඣිමනිකායේ සූත්‍රවල සජාතීය ලක්ෂණ නොහඟවන සංකීර්ණතාවන්ද දකිය හැකිය. මේ බව පහත කරුණුවලින් පැහැදිලි වේ.

   1. බුද්ධ චරිතය සම්බන්ධ කරුණු සඳහන් සූත්‍ර අන්තර්ගත වීම
      අරියපරියේසන, මහාසීහනාද, මහාසච්චක සූත්‍ර

2. ධර්මකාරණා අන්තර්ගත සූත්‍ර
චූලමාලුඞ්ක්‍ය, සතිපට්ඨාන, චූලහත්ථිපදෙපම, මහාහත්ථිපදෙපම, චූලවේදල්ල, මහාවේදල්ල, අලගද්දූපමවැනි සූත්‍ර

3. විනය හා සම්බන්ධ සූත්‍රද ඇත.
භද්දලි සූත්‍රය, ගුලිස්සානි, කීටාගාරී වැනි සූත්‍ර

4. ආඛ්‍යාන ස්වරූප ගන්නා ලද සූත්‍රද ඇති බව වින්ටර්නිට්ස්පවසයි. ඔහු ඒ සඳහා
අඞ්ගුලිමාල හා රට්ඨපාල සූත්‍ර නිදසුන් ලෙස දක්වයි.

5. ජාතක කථා ආශ්‍රයෙන් ගොඩනගා ගත් සූත්‍ර
මඛාදෙව, ඝටීකාර සූත්‍ර

6. මජ්ඣිමනිකායේ ශ්‍රාවක භාෂිත සූත්‍ර බොහෝමයක් දැකගත හැකිය.

1. සැරියුත් හිමි - මහාහත්ථිපදෙපම, රථවිනීත, මහාවේදල්ල, අනංගන, සම්මාදිට්ඨි, ගුලිස්සානි, ධනඤ්ජානි, සච්චවිභංග, මහාගොසිංහ, අනාථපිණ්ඩිකොවාද, ඡන්නෝවාද යන සූත්‍ර.
2. අනඳ හිමි - ගොපකමොග්ගල්ලාන, බාහිතික, සන්දක, සේඛ, අට්ඨකනාගර යන සූත්‍ර.
3. මොග්ගල්ලාන හිමි - අනුමාන හා මාරතජ්ජනීය සූත්‍ර
4. උදයී තෙර - බහුවේදනීය සූත්‍රය
5. උදේන හිමි - ඝොටමුඛ සූත්‍රය
6. බක්කුල හිමි - බක්කුල සූත්‍රය
7. අනුරුද්ධ හිමි - අනුරුද්ධ සූත්‍රය
8. ධම්මදින්නා භික්ෂුණිය - චූල්ලවේදල්ල සූත්‍රය.



මේ අනුව මජ්ඣිමනිකායේ 1/6 පමණ ශ්‍රාවක භාෂිත හැටියට හඳුනාගත හැකිය. භික්ෂුණියක විසින් දේශිත සූත්‍රයක් ඇති හෙයින් එයද සුවිශේෂීය.

## සංයුත්ත නිකාය

වර්ග සමූහයක් එක්වූයේ නම් එය සංයුත්ත වන්නේය. බුදුරජාණන් වහන්සේ දේව, බ්‍රහ්ම, යක්ඛ, භික්ඛුණී ආදී වශයෙන් නාමිකව යමෙකුට ධර්මය දේශනා කර ඇත්නම් එකී සියලු ධර්ම කරුණු සංයුත්තනිකායේ අන්තර්ගත වේ. සූත්‍ර පිටකයේ තුන්වන නිකාය වූ සංයුත්තනිකාය බණවර සියයකින් පරිමිත කෘතියක් බව අටුවාවන්හි සඳහන් වේ.[36] එහි මූලික පරමාර්ථය ඥාන ප්‍රභේද ජනනයයි.[37] බුදුසමයෙහි සඳහන් සියලු දර්ශනික කරුණු සංයුත්තනිකායේදී සාකච්ඡාවට භාජනය වී ඇති බැවින් එය පරිශීලනය කරන්නාගේ ධර්මඥානය බෙහෙවින් තීව්‍ර වේ. පටිච්චසමුප්පාද, ධාතු, කිලෙස, ඣාන, සළායතන, වේදනා, අසංඛත, අව්‍යාකත, මග්ග, බොජ්ඣංග, සතිපට්ඨාන, ඉන්ද්‍රිය, බල, ඉද්ධිපාද, අනාපානසති, සච්ච යනාදි ධර්ම කරුණු සංයුත්තනිකායේ සූත්‍රවලදී විග්‍රහයට ලක් කෙරේ.[38]

සංයුත්තනිකායෙහි විශිෂ්ටතා කියනු කැමති බුද්ධඝෝෂාචාරීන් වහන්සේ සංයුත්තනිකායට්ඨ කථාවෙහි මෙසේ විග්‍රහ කර ඇත.

"සංයුත්තවග්ග පතිමණ්ඩිතස්ස සංයුත්ත ආගමවරස්ස
බුද්ධානුබුද්ධසංවණ්ණිතස්ස ඤාණප්පභෙදජනනස්ස"[39]

සංයුත්තනිකායේ මාතෘකා අනුව සූත්‍ර වර්ග කිරීමක් දැකගත හැකිය. (මාර, කෝසල, භික්ඛු, සක්ක, යක්ඛ ආදි) මෙසේ ක්‍රමවත් වර්ග කිරීමක් සහිත සංයුත්ත 56ක් සංයුත්ත නිකායේ ඇත. මාතෘකා අනුව සූත්‍ර වර්ග කිරීමේ ක්‍රමවත් භාවය නිසා "වින්ටර්නිට්ස්" සෙසු නිකායන්ට වඩා සංයුත්තනිකායේ සූත්‍ර වර්ග කිරීමේ ක්‍රමවත් බව පෙන්වාදී ඇත. ඇතැම් සූත්‍රවල අන්‍යයන්ගේ භාෂිත ගාථාවලින් දක්වේ. බොහෝ විට මෙසේ දක්වා ඇත්තේ දෙවියන්ගේ හා බ්‍රහ්මයන්ගේ අදහස්ය. සංයුත්ත නිකායේ සගාථකවග්ගයේ බහුලව ඇත්තේ එබඳු ගාථාය. ප්‍රශ්න

හා පිළිතුරුවලින් සමුපේත ගාථාද ඇත. මෙසේ සංවාද ස්වරූපයෙන් ගාථා ඉදිරිපත් කර ඇත්තේ ධර්මමය කාරණා මතක තබා ගැනීමේ පහසුව සලකාගෙනය.

සංයුත්තනිකායේද ශ්‍රාවක භාෂිත රාශියක් දැකිය හැකිය. එක් එක් භික්ෂුවට පවරා ඇති සංයුත්තයන්හි බොහෝ විට ඊට අදාළ භික්ෂුවගේ දේශනා ඇතුළත් වී ඇත. නිදානවග්ගයේ භික්ඛු සංයුත්තයේදී සාරිපුත්ත, මොග්ගල්ලාන, ලකුණ්ටකභද්දිය, ආදි තෙරවරුන්ගේ දේශනා දක්නට ලැබේ.

ඛන්ධකවග්ග සංයුත්තයේ නකුලපිතුවග්ගයේ සැරියුත් හිමි දිල්ලිකානි ගෘහපතියාට දෙසූ දහම් කොටසක් දක්වේ. එහි අවිජ්ජාවග්ගයේ සැරියුත් මහාකොට්ඨිත දෙනමගේ ධර්ම සාකච්ඡාවක් ඇත. සාරිපුත්ත සංයුත්තයේ ආනන්ද හිමියන්ගේත්, සුචිමුඛී පරිව්‍රාජිකාවගේත් ප්‍රශ්නවලට සැරියුත් හිමි දෙන ලද පිළිතුරු දක්නට ඇත. සළායතනවග්ග සංයුත්තයේ පිණ්ඩෝලභාරද්වාජ තෙරුන් උදේන රජුට දෙසූ දේශනයක්ද මහාකච්චායන තෙරුන් ලොහිච්චට දෙසූ දේශනාවක්ද ඇත. මොග්ගල්ලාන සංයුත්තයේ මුගලන් හිමි භික්ෂූන්ට දෙසූ දහම් කොටස් පමණක් නොව තව්තිසා දෙවියන්ට දෙසූ දහම් කොටස්ද ඇත. මහාවග්ග සංයුත්තයේ එන මග්ගසංයුත්තයේ අනඳ හිමි භද්‍ර හිමිට දෙසූ ධර්මයක්ද ඇත. මීට අමතරව ධරමාන බුදුන් දවස විසූ තෙරවරුන් දෙසූ ධර්ම කොටස් සංයුත්ත නිකායේ දක්නට ලැබේ.

සංයුත්තනිකායේ සූත්‍ර ගණන 7762ක් යැයි අටුවා කිහිපයකම ගද්‍ය පද්‍ය දෙකෙන්ම දක්වා ඇත.[40] එහෙත් දැනට මුද්‍රණය වී ඇති කිසිඳු සංස්කරණයක මේ සූත්‍ර සංඛ්‍යාව දැකිය නොහැකිය. එංගලන්තයේ පාළි පොත් සමාගම මඟින් කරන ලද මුද්‍රණයේ ඇත්තේ සූත්‍ර දෙදහස් අටසිය අනූනමයකි. වින්ටර්නිට්ස් දක්වා ඇත්තේද එම සංඛ්‍යාවයි.[41] පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් පෙන්වා දෙන අන්දමට පෙය්‍යාල එක්කොට ගණන් ගතහොත් දැනට ඇති සංයුත්තනිකායේ සූත්‍ර ගණන නමදහස් හත්සිය විසිහයකි. මෙය අටුවාවේ දක්වා ඇති ගණනට වඩා සූත්‍ර



එක්දහස් නමසිය හැට හතරකින් වැඩිය. පෙය්‍යාලම අතහැරියහොත් සංයුත්තනිකායේ සූත්‍ර ගණන හයදහස් එකසිය හතළිස් හයක් දක්වා අඩුවන බව උන්වහන්සේ පවසති.[42] මෙය අටුවාවේ දක්වා ඇති සූත්‍ර සංඛ්‍යාවට වඩා සූත්‍ර එක්දහස් එයසිය දහසයකින් අඩුය. එහෙයින් බුද්ධදත්ත නාහිමියන් පෙන්වා දෙන අන්දමේ සූත්‍ර ප්‍රමාණයක් හා සැසඳෙන සංයුත්තනිකාය සංස්කරණයක් මෙතෙක් මුද්‍රණය වී නැති බව පමණක් පැවසීම මෙහිලා ප්‍රමාණවත් බව මහාචාර්ය ඔලිවර් අබේනායකයන් පවසයි.[43] මේ අනුව අපට ප්‍රකට වන්නේ සංයුත්තනිකායේ සූත්‍ර ප්‍රමාණය පිළිබඳව විද්වතුන් අතර විවිධ මත දක්නට ඇති බවයි. එහෙත් අටුවාවල සඳහන් තොරතුරු අනුව මෙහි සූත්‍ර සංඛ්‍යාව 7762 කි.

විශේෂයෙන්ම සංයුත්තනිකායෙහි පුනරුක්ත ක්‍රමයෙන් සූත්‍ර දීර්ඝ වී තිබීමට හේතු වශයෙන් කරුණු කිහිපයක් කෙරෙහි විචාරකයින්ගේ අවධානය යොමුව ඇත. ඒවා පහත ආකාරයට දැක්විය හැකිය.

1. අතීතයේදී ශුද්ධ සාහිත්‍යයන් පවත්වාගෙන එන ලද්දේ කටපාඩමිනි. අමතක වුවහොත් යම් යම් කොටස් අභාවයට යතැයි යන බිය මෙහිදී බලපවත්වන ලද්දේය. මේ ක්‍රමයෙන් ගැලවෙනු පිණිස යොදගත් එක් උපක්‍රමයක් නම්, එකම දේ යළි යළිත් කියවෙන පරිද්දෙන් කරුණු සංග්‍රහ කිරීමය.කෙනෙකු කට පාඩමින් ගෙනා කොටසක් අමතක වුවහොත් හෝ වෙනකෙකුට දීමට කලින් මියගිය හොත් හෝ වැඩි පාඩුවක් නොවුණු පිණිස එකම මාතෘකාව විවිධ ක්‍රමයෙන් විස්තර කෙරෙන සූත්‍රාන්ත විවිධ පුද්ගලයින් විසින් මතක තබාගන්නා ලදී. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන අවස්ථාවේ ඒ සියල්ල ලියා තැබීය. පුනරුක්ත මග හැර ග්‍රන්ථ සංස්කරණය කළ යුතු යැයි මෙහිදී අදහස් කෙරුණේ නැත. පෙළ ග්‍රන්ථවල එන පුනරුක්ත මේ ක්‍රමයෙන් ඇති වූ ඒවා බව මහාචාර්ය ඔලිවර් අබේනායක පවසයි.[44]

2. විවිධ ආචාර්ය පරම්පරා තුළ ශිෂ්‍යයන්ට ධර්මෝද්ග්‍රහණය කරවනු පිණිස ආගමික අභ්‍යාස ක්‍රමයක් විය. බුද්ධ ධර්මයෙන් ඉගැන්වෙන විවිධ ධර්ම කාරණා විවිධ අයුරින් විග්‍රහ කිරීම සහ කරවීම මෙහිදී සිදු කෙරිණ. මේ නිසා එක් එක් ගුරුකුලය තුළ විවිධ ධර්ම මාතෘකා යටතේ විවිධ අභ්‍යාස ප්‍රයෝජනයට ගන්නා ලදී.[45]

3. ශුද්ධ සාහිත්‍යය පෝෂණය විය හැකි මූලාශ්‍රය හතරක් මහාපදේශවලින් ඉගැන්වේ. සූත්‍රයන්හි බහාලිය හැකි නම් විනයෙහි හා සැසඳේ නම් මූලාශ්‍රය මඟින් ප්‍රභව වන ඉගැන්වීම් ප්‍රාමාණික බුද්ධ වචනය සේ ගැනීමට මේ දේශනා අවසරදී තිබේ. මේ යටතේ බුදුන් වහන්සේගේ දුෂ්කර ඉගැන්වීම් විශද කරනු පිණිස විග්‍රහ විවරණ සැපයීම නොයෙක් විහාරාරාමවල විසූ ධර්මධර යතිවරයන් අතින් සිදුවන්නට ඇත. මේවා පරපුරින් පරපුරට නොනැසී පවත්වාගෙන අවුත් ත්‍රිපිටක ග්‍රන්ථාරූඪයේදී ශුද්ධ සාහිත්‍යයට එකතු විය. ධර්මධර යතිවරයන් පමණක් නොව පර්යාපත්තියෙහි නිපුණ ගිහියන් නිසාද සූත්‍ර සාහිත්‍යය මේ අන්දමට වර්ධනය වන්නට ඇත.[46]

සංයුත්තනිකායේ සූත්‍ර වර්ග කිරීමේදී ප්‍රධාන මූල ධර්ම තුනක් පදනම් කොටගත් බව වින්ටර්නිට්ස් පෙන්වා දෙයි.

1. කිසියම් ධර්ම කාරණයක් සාකච්ඡාවට භාජනය කිරීම. (නිදාන, අභිසමය, ධාතු, ඛන්ධ, සම්මප්පධාන, මග්ග, සච්ච ආදී සූත්‍රයන්හි සංග්‍රහ වී ඇති බොහෝ සූත්‍ර මේ ගණයට ඇතුළත් වේ.

2. විවිධ ගණයන්ට වැටෙන යක්ඛ, මනුෂ්‍යාදීන්ට සම්බන්ධයක් දක්වීම. (දේවතා, දේවපුත්ත, මාර, භික්ඛුණී, බ්‍රහ්ම, සක්ක, නාග)



3. බුදුන් දවස විසූ ප්‍රමුඛ ශ්‍රාවකයන් සමඟ ඇති සබඳකම. (කස්සප, රාහුල, භික්ඛු, රාධ, සාරිපුත්ත, වච්ඡගොත්ත, මොග්ගල්ලාන, චිත්ත)[47]

සංයුත්තනිකායෙහි සඳහන් සූත්‍ර ප්‍රමාණය ගැන සිතන විට බුද්ධ චරිතයට අදාළ කර ගත හැකි සූත්‍ර ඇත්තේ ඉතා ස්වල්පයකි. බුදුවීමට පෙරත් ඉන් පසුවත් බුදුන් වහන්සේ හා මාරයා අතර පැවති සම්බන්ධයක් පැවසෙන සූත්‍ර රාශියක් මාර සංයුත්තයේ ඇත. සක්ක, බ්‍රහ්ම ආදි අනෙක් සංයුත්තයන් සම්බන්ධයෙන්ද මේ ප්‍රකාශය සැසඳේ. ඉන්ද්‍රිය සංයුත්තයේ පරිනිබ්බාන සූත්‍රය දීඝ නිකායේ එන මහා පරිනබ්බාන සූත්‍රයට වස්තු බීජ වී ඇති බව උගතුන්ගේ පිළිගැනීමයි.[48]

## අඞ්ගුත්තර නිකාය

එක එක අඞ්ග වැඩිවී යන නිසා මේ ග්‍රන්ථයට අඞ්ගුත්තර නිකාය යැයි කියති. මෙහි සූත්‍ර 9557 කි.[49] මෙය ප්‍රථම සංගීතියේදී සංගායනා කර අනුරුද්ධ හිමියන්ට පවරන ලදී. මෙහි සූත්‍ර සංග්‍රහ කර ඇත්තේ නිපාත නාමයෙනි. එවැනි නිපාත එකොළහක් ඇත. අංගුත්තර නිකායේ සංඛ්‍යා නියමය උඩ සූත්‍ර වර්ග කිරීමක් දක්නට ලැබේ. ඒකක නිපාතය, ද්වික නිපාතය, තික නිපාතය ආදි වශයෙනි. එහිදී ඒ ඒ නිපාතයේ අංකයට සරිලන ආකාරයෙන් සූත්‍ර සකස් වී ඇත.

ඒකක නිපාතයේ එක් කරුණක් පිළිබඳ සඳහන්වන සූත්‍ර 632ක් ඇත. එම සූත්‍ර 632 වර්ග 16 බෙදේ. එහි ප්‍රථම සූත්‍රයෙන් ප්‍රකාශ වන්නේ "මහණෙනි මිනිසාගේ සිත් ඇදගන්නා රූප අතර කාන්තාවගේ රූපය තරම් තවත් වෙන ප්‍රබල රූපයක් නැත." යන කාරණයයි. මෙසේ දෙවැනි තුන්වැනි සූත්‍රවලින්ද මිනිස් සිත ඇදගන්නා රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන කරුණු අතරින් ස්ත්‍රියගේ ශබ්දය, ගන්ධය, රසය, ස්පර්ශය යන කරුණු ඉතා ප්‍රබල බව ප්‍රකාශ වේ. මෙසේ ඒකක නිපාතයේ නීවරණප්පහාන වග්ග 16න්ම ඉදිරිපත් කරන සියළුම සූත්‍රවලින් ප්‍රකාශ වන්නේ එක් කරුණක් පමණි. මේ අනුව මෙම නිකායේ පුනරුක්ත

බොහෝමයක් දත හැකිය. ද්වික නිපාතයේ කරුණු දෙකක් පිළිබඳ කිය වේ. තික නිපාතයේ කරුණු තුනක් ගැන කියවේ.

මේ අයුරින් වර්ග කර ඇතත් ඒ ඒ නිපාතයන්හි අවශ්‍යයෙන්ම තිබිය යුතු මූලික කරුණු උවමනාවෙන්ම යටපත් කර ඇති ස්වභාවයක්ද දක්නට ඇතැයි උගත්තු පවසති. නිදසුන් ලෙස : චතුක්ක නිපාතයේ චතුරාර්ය සත්‍යය අනිවාර්යෙන්ම තිබිය යුතුය. එහෙත් ඒ පිළිබඳව චතුක්ක නිපාතයේ සඳහන් වී නැත. එසේම අට්ඨකනිපාතයේද එබඳු ඌණතාවක් ඇත. අවශ්‍යයෙන්ම තිබිය යුතු ආර්ය අෂ්ටාංගික මාර්ගය ගැන එහි සඳහනක්වත් නැත.

අංගුත්තරනිකායේ සංඛ්‍යා නියමය උඩ සූත්‍ර වර්ග කිරීම නිසා ඇති වී ඇති දුබල තාවයක් නම් එකම කරුණ නැවත නැවතත් විස්තර කිරීමයි. තික නිපාතයේ කාලාම සූත්‍රයේ දෙතැනකම එකම කරුණු වෙනස් නම්වලින් විස්තර කර ඇත.

අනිකුත් නිකායන් හා සසඳන විට අංගුත්තර නිකායේ ශ්‍රාවක භාෂිත ප්‍රමාණය අල්පය. පඤ්චක නිපාතයේ මුණ්ඩරාජවග්ගයේ එන නාරද තෙරුන්ගේ දේශනය බුද්ධ පරිනිර්වාණයේ පසුව දෙසන ලද්දකි. එය දේශනා කර ඇත්තේ බිම්බිසාර රාජ පෙළපතේ අන්තිම රජු වශයෙන් සැළකෙන මුණ්ඩ නම් රජුගේ කාලයේය.

පඤ්චක නිපාතයේ යමකවග්ගයේ බුදුන්වහන්සේ භික්ෂූන්ට දහම් දෙසා අනතුරුව තමන්වහන්සේගේ පිට රිදෙන බව කියා සැරියුත් හිමිට භාර කළ සූත්‍රයක් ඇත. එකාදස නිපාතයේ අට්ඨකනාගර දසම නම් ගෘහපතියාට අනඳතෙරුන් දෙසූ දේශනයක් ඇත. මේ අනුව මුල් නිකාය හතරේම ඇතැම් සූත්‍ර පශ්චාත් කාලයක ශ්‍රාවකයන් විසින් ප්‍රවිෂ්ට කරන ලද ඒවාද ඇත.

## ඛුද්දක නිකාය

මෙය තනි පොතක් නොවේ. මෙහි ග්‍රන්ථ 15කි. සියලු විනය පිටකයත්, අභිධර්ම පිටකයත්, නිකාය සතරත් හැර ඉතිරි බුද්ධ වචනය ඛුද්දක නිකාය බව බුද්ධඝෝෂාචාරිහු පවසති.[50] මෙය



පොදුවේ සියලු භික්ෂූන්ට පාඩම් කරගෙන ආරක්ෂා කිරීමට නියම වූ බව සඳහන් වේ.

ඛුද්දකනිකාය සෙසු නිකාය සතරටම වඩා වෙනස්ය. වරින්වර පොත් එකතු වී වර්ධනය වූ එය කාලාන්තරයක් තිස්සේ වූ සංවර්ධනයක ප්‍රතිඵලයක් වශයෙන් හඳුන්වා දිය හැකිය. ශ්‍රාවක භාෂිත වැඩි වශයෙන් ඇත්තේ ඛුද්දක නිකායේය. එහි තනි සූත්‍ර පමණක් නොව ඇතැම් ග්‍රන්ථ පිටින්ම ශ්‍රාවකයන්ට පැවරේ. ඒ අනුව ඛුද්දක නිකාය පිළිබඳ ඇති විවිධ මත පහතාකාරයට ගොනු කළ හැකිය.

1. ඛුද්දක පාඨය ඇතුම්විට සාමණේරයන්ගේ ප්‍රයෝජනය සඳහා පසුකාලයක ලංකාවේදී පිළියෙල කරන ලද්දක් සේ විශ්වාස කරයි.

2. විමානවත්ථු පේතවත්ථු මුගලන් හිමිට පවරා ඇත.

3. ථෙර ථෙරී ගාථාවල ඇත්තේ ශ්‍රාවක භාෂිතය.

4. නිද්දේසය සැරියුත් හිමියන්ගේ කෘතියකැයි එම අටුවාවේ සඳහන් වේ.

5. පටිසම්භිදාමග්ගය ධර්මධර තෙරනමක් විසින් පසුකාලයක රචනා කරන ලදැයි සිතිහැකි තරම් සාධක ග්‍රන්ථය පුරාවටම ඇති බව ඔලිවර් අබේනායක පවසයි.

6. අපදානයේ ඇත්තේ ථෙර ථෙරණියන්ගේ චරිත කථාය.

7. බුද්ධවංශ, චර්යා පිටක යන දෙක සම්ප්‍රදය විසින් බුදුන් වහන්සේට පවරා දී ඇතත් ඒවා අමිස පූජාව සම්භාවනාවට ලක් වූ යුගයකට අයත් කෘති වශයෙන් හැඳින්විය හැකිය.

8. ඛුද්දකනිකායේ බුද්ධ දේශනා බහුලව ඇත්තේ සුත්තනිපාතය, උදාන, ඉතිවුත්තක, ධම්මපද යන කොටස්වල හා ජාතකවලය.

ඛුද්දකනිකාය හා ශ්‍රාවකයන් අතර සබැඳියාව කොතෙක්ද කිවහොත් "යුවං චුවං" නම් චීන භික්ෂුව ඛුද්දකනිකාය හැඳින්වීමට "ශ්‍රාවක පිටක" යන ප්‍රයෝගය උපයෝගි කර ගෙන ඇත. ඛුද්දක නිකාය පිළිබඳ බුද්ධඝෝෂ මතය කුමක් වුවත් ඒ පිළිබඳව ගැටළු කිහිපයක් මතු කර ඇත. ශ්‍රාවක භාෂිතයන් අතර වැඩිම දේශනා කර ඇත්තේ සැරියුත් හිමි බව පැහැදිලි වේ. බුද්ධ භාෂිතය පිළිබඳව අනඳ හිමි සඳහන් කරන තැන තමන් වහන්සේ ශ්‍රාවකයන්ගෙන් ධාරණය කරගත් ධර්ම දෙදහසකැයි පවසති.[51]

## අභිධම්ම පිටකය

'ධම්ම' යන පදයට 'අභි' යන උපසර්ගය එක්වීමෙන් 'අභිධම්ම' යන අව්‍ය සමාස පදය නිර්මාණය වී ඇත. බුද්ධඝෝෂ හිමියන් පෙන්වා දෙන්නේ 'අභි' උපසර්ගය යෙදූ විට අතිරේක ධර්මය, විශේෂ ධර්මය යන අර්ථ ලබා දෙන බවයි.[52] මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ ධර්ම සංඛ්‍යාත සූත්‍ර පිටකයට වඩා අතිරේකවූත් විශේෂවූත් ධර්මය 'අභිධම්ම' නම් වන බවයි. සුමංගල විලාසිනියේ අභිධම්ම යන්නට අර්ථ දෙකක් දක්වා ඇත. එනම්, 1. අභිධම්ම යනු සප්තප්‍රකරණයයි. 2. මාර්ගඵල අභිධර්මයයි.[53] වශයෙනි. මජ්ඣිම නිකායේ කින්ති සූත්‍රයේ " අභිධම්ම" යන්නට විශිෂ්ට ධර්මයෙහි යන අර්ථයෙන් සත්තිස් බෝධිපාක්ෂික ධර්මයක් දක්වා ඇත.[54] අභි හා ධම්ම යන පද දෙකෙහි සමවායෙන් ගොඩනැගුණු පදයක් වශයෙන් අභිධම්ම දක්වා එමඟින් විශේෂ ධර්මය යන්න (Special Dhamma) අර්ථවත්වන බව රීස් ඩෙවිඩ්ස් පවසයි.[55]

අභිධර්ම පිටකය ප්‍රකරණ සතකින් සමන්විතය. එනම්, ධම්මසංඞ්ගිණිණී විභංග, ධාතුකථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන වශයෙනි. විනය පිටකය "පාලි" යනුවෙන්ද සූත්‍ර පිටකය "නිකාය" යනුවෙන්ද බෙද දක්වා ඇති අතර මෙම ග්‍රන්ථය හඳුන්වා ඇත්තේ "ප්‍රකරණ" යන නාමයෙනි. අභිධර්මය බුදුන්වහන්සේගෙන් ප්‍රභවය වීය යන්න පිළිබඳ මතභේදයක් නැත. එහෙත් සප්තප්‍රකරණ බුදුන්වහන්සේට



පැවරීම පිළිබඳ ආදියෙහි පටන්ම ඒකමතික තිරණයක් නොතිබුණු බව අටුවා කෘති පරීක්ෂා කිරීමෙන් වුවද දත හැකිය.

බුදුරජාණන් වහන්සේගේ දේශනා ආදිම අවස්ථාවේ සංග්‍රහ කර තිබුණේ "ධම්ම විනය" යන කොටස් දෙකෙහිය. බුදුන්වහන්සේගේ දේශනා සංගෘහිත ප්‍රධාන මාතෘකාවක් වූ අභිධර්මය මේ අවස්ථාවේදී දක්නට නොලැබේ. ප්‍රථම සංගායනාවේදී ධර්මය නමින් සංගායනා කළේ සූත්‍ර පිටකයෙහි අන්තර්ගත නිකාය පහ බව ප්‍රථම සංගීති වාර්තාවෙන් පෙනේ. මේ අනුව ආදිම අවස්ථාවේ දක්නට ලැබෙන්නේ ධම්ම විනය යන පිටක දෙක පමණි. එසේම මුල් බුදුසමයෙහි දේශක සූත්‍ර සාහිත්‍යය මෙන්ම පශ්චාත් කාලීන බිහි වූ පාලි සාහිත්‍යය කෘති තුළින්ද සියලු බුද්ධ වචනය හැඳින්වීම සඳහා යෙදී ඇත්තේ ධම්ම විනය යන පද දෙකයි.[56]

අභිධර්ම නමින් පිටකයක් වූ බවට තොරතුරු ලැබෙන්නේ පශ්චාත් කාලීන මූලාශ්‍රවලිනි. ඒ අනුව ප්‍රථම සංගීති අවස්ථාවේ අභිධර්ම පිටකයක් සංගායනා නොවීමෙන් ප්‍රකට වන්නේ ඒ අවස්ථාවේදී අභිධර්ම පිටකයක් වශයෙන් සම්පූර්ණ වී නොතිබීම පමණක් නොවන බවත්, අභිධර්ම දේශනා සූත්‍ර විනය දේශනා තරම් වැදගත් නොවන බව මහා ශ්‍රාවකයින් වහන්සේලා පිළිගත් බවද, එයින් පැහැදිලි වන බව මහාචාර්ය ඔලිවර් අබේනායක පවසයි.[57] අභිධර්ම දේශනා වශයෙන් සැළකිය යුතු සූත්‍ර රාශියක් එකල වූයේ නම් නිසැකයෙන්ම ඒවා සංගායනා කළ බව චුල්ලවග්ගයේ සඳහන් විය යුතුව තිබුණි. අභිධර්මය ප්‍රථම සංගීතියේදී සංගායනා වූ බව සඳහන් කරන්නේ සංගායනා පිළිබඳ මූලික තතු හෙළිකරන පඤ්චසතිකක්ඛන්ධකය නොව ඉන් සියවස් ගණනාවකට පසු රචිත යැයි සිතිය යුතු පාලි අටුවා ග්‍රන්ථයන්ය.ඒ අනුව අභිධර්මය බුද්ධභාෂිතයක් යැයි ඔප්පු කිරීමට සමන්තපාසාදිකාවත්, සුමංගලවිලාසිනියත්, අත්ථසාලිනි අටුවාවත් බොහෝ සෙයින් යත්න දරා ඇත. පිටකත්‍රයේ එන අන් කිසිඳු සූත්‍රයක් හෝ ශික්ෂාපදයක් බුද්ධ භාෂිතයක් යැයි හැඳින්වීමට උත්සාහගත් තැනක් හමු නොවේ. එසේ තිබිය දී අභිධර්මය සම්බන්ධයෙන් පමණක් එය බුද්ධ භාෂිතයක් යැයි

හැඳින්වීමට යත්න දරා ඇත්තේ මේ සම්බන්ධයෙන් විවිධ මත පවතින්නට ඇති නිසා යැයි සිතිය හැකිය. අභිධර්මය බුදුරජාණන් වහන්සේ විසින්ම දේශනා කරන ලද්දක්ය යන්නට පිළිතුරු සපයන අත්ථසාලිනි අටුවාව ප්‍රථම ආභිධම්මිකයා බුදුරජාණන් වහන්සේ බවත්, එහි වාචනා මාර්ගය සැරියුත් හිමියනගෙන් ප්‍රභවය වී ඇති බවත් දක්වයි.[58]

අභිධම්ම යන වචනය මුල් බුදුසමයේ දේශිත සූත්‍ර සාහිත්‍යය තුළ තනි වචනයක් සේ යෙදී නැති බව පෙනේ. එය නිතරම හමුවන්නේ අභිවිනය යන පදයත් සමගමය. "අභිධම්මෙ බො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො සංසංදෙති, පුනච පරං ආවුසො භික්ඛු ධම්මකාමො හොති පියසමුදහාරො අභිධම්මෙ අභිවිනයෙ උළාරා පාමොජ්ජෝ"[59] මේ අනුව අභිධර්මයේ සප්‍රාණිකත්වය පිළිබඳව ථෙරවාදි සම්ප්‍රදයේ මතය කෙසෙවුවත් නූතන විචාරකයින්ගේ හැඟීම අනුව අභිධර්මයේ සප්‍රාමාණිකත්වයට ඍජුව බලපාන කරුණු කිපයක් ගෙන හැර දක්වා ඇත. ඒවා පහතාකාරයට ගොනු කර දැක්විය හැකිය.

1. අභිධර්මයට විනය සූත්‍රාදී පිටකයන්ට මෙන් නිදනයක් නොපැවතීම.
2. මූලිකදේශනාවන්හි අභිධර්මය යනුවෙන් විශේෂ ධර්ම පරියායක් නොතිබීම.[60]
3. අභිධර්ම පිටකයට අයත් පස්වැනි ග්‍රන්ථය වන කථාවත්ථුවබුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙසිය දහ අටකට පසුව විසූ මොග්ගලි පුත්තතිස්ස හිමියන් විසින් රචනා කිරීම.
4. ප්‍රථම සංගායනාවේදී අභිධර්මය සංගායනා නොවීම,[61] හා භාණක පරපුරකට එය නො පැවරීම.
5. විවිධ බෞද්ධ සම්ප්‍රදයයන් විසින් වෙනස් වූ අභිධර්ම පිටකයන් දක්නට ලැබීම.
6. නිෂ්පුද්ගල අකර්තෘක ග්‍රන්ථයක් වශයෙන් අභිධර්මය දක්නට ලැබීම.



7. මහාවිහාර සම්ප්‍රදය තුළම අභිධර්ම බුද්ධ භාෂිතයක්ද නොවේද යන්න පිළිබඳව වාද විවාද පැවතීම.[62]

අභිධර්මයට නිදනයක් නැතයි යනුවෙන් සඳහන් කරන ප්‍රශ්නයට පිළිතුරු දෙන අත්ථසාලිනි අටුවාව සඳහන් කරන්නේ ග්‍රාමවාසී සුමන දෙව නම් තෙර නමක් ලෝහ ප්‍රාසාදයේ වැඩ සිට ධර්මය දේශනා කරමින් "එකං සමයං භගවා දෙවෙසු විහරති තාවතිංසෙසු පරිච්ඡත්තකමූලෙ පණ්ඩුකම්බිලසිලායං තත්‍ර බො භගවා දෙවානං තාවතිංසානං අභිධම්මකථං කථෙසි කුසලා ධම්මා අකුසලා ධම්මා අව්‍යාකථා ධම්මාති"[63] යන පාඨය එහි නිදනය යැයි දක්වයි. එහෙත් මෙම නිදනය කිසිම අභිධර්ම පොතක හෝ ත්‍රිපිටකයේ අන් පොතක හෝ නැති බවත්, එහෙයින් එය එතුමන් විසින් ගොතා කියන ලද්දක් බවත්, එබැවින් එවැනි දුර්වල සාධකයන් පවා ගෙනහැර පෑමෙන් පෙනී යන්නේ මෙය සර්වඥභාෂිතයක් යැයි ඔප්පු කර ගැනීමට බලවත් අපහසුතාවයක් තිබී ඇති බව යැයි මහාචාර්ය පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ පවසති.[64]

සර්වාස්තිවාදී නිකායිකයන්ටද අභිධර්ම ප්‍රකරණ සතක් ඇත. එම ප්‍රකරණ පාලි පොත්වල සඳහන් කරුණු හා සැමතැනකදීම සැසඳෙන්නාහු නොවෙති. ඒ ප්‍රකරණ සතම රහත් මහා තෙරවරුන්ගේ කෘති බව නොසගවා කියති.

1. ධර්මස්කන්ධශාස්ත්‍ර - ශාරිපුත්‍ර මහාස්ථවිර
2. ප්‍රඥප්තිශාස්ත්‍ර - මෞද්ගල්‍යායන මහාස්ථවිර
3. ධාතුකායශාස්ත්‍ර - පූර්ණ මහතෙර
4. විඥනකායශාස්ත්‍ර - දේවශර්මන් මහතෙර
5. ඥනප්‍රස්ථානශාස්ත්‍ර - කාත්‍යායනීයපුත්‍ර මහතෙර
6. ප්‍රකරණපාදශාස්ත්‍ර - වසුමිත්‍ර මහතෙර
7. සංගීතිපර්යායශාස්ත්‍ර - මහාකෞෂ්ඨිල මහතෙර[65]

මුළු ත්‍රිපිටකය සම්බන්ධයෙන්ම පර්යේෂනය කළ උගතුන් දෙදෙනෙකු වන රීස් ඩේවිස්[66] හා බී.සී.ලෝ[67] ත්‍රිපිටකයේ අනුපිළිවෙල පරීක්ෂා කර පහතාකාරයට වෙනස් අර්ථකථන

දෙකක් දක්වා ඇත. අභිධර්ම පිටකට එකම යුගයක සම්පූර්ණත්වයට පත් වී ඇති බව රීස් ඩේවිඩ්ස් මහතා ප්‍රකාශ කරයි. එහෙත් බී.සී. ලෝ මහතා ප්‍රකාශ කරනුයේ අභිධර්ම පිටකයේ ඇති ග්‍රන්ථ එක් එක් යුගවලදී සංග්‍රහ වූ ඒවා බවයි.

## සමාලෝචනය

ත්‍රිපිටක සාහිත්‍යය හා එහි ආකෘතික ස්වභාවය පිළිබඳව සිමසීමේදී ඒ වර්ග කිරීම තුළ යම් යම් විසදෘශතා දක්නට ඇත. වෙසෙසින්ම බටහිරි උගතුන්ගේ පර්යේෂණයන්හි මේ පිළිබඳ විවෘත අධ්‍යයනවලින් පසුව ඉදිරිපත් කළ අදහස් දක්නට ලැබේ. එවැනි කරුණු කිහිපයක් ඉහතදී අධ්‍යයනය කර තිබේ. මුල්කාලයේ ධර්මයට මූලිකත්වයක් ලැබුණු අතර පසුව ඇති වූ ඓතිහාසිකත්වය මත විනය මූලිකත්වයට පැමිණි බව පැහැදිලිය. විනය පිටකය පිළිබඳව විමසීමේදී කේ.ආර්. නෝමන් මහතාගේ අදහසට අනුව විනය පිටකය තරම් සංස්කරණයන්ට භාජනය වූ වෙනත් කිසිදු ග්‍රන්ථයක් නොමැත. එසේම චුල්ලවග්ගපාලියේ එන ඇතැම් විස්තර විනය සම්බන්ධයෙන් නම්‍යතාවක් දක්නට නොලැබෙන බවද ඔහුගේ මතයයි.[68] එසේම පරිවාරය පිළිබඳව උගතුන් අතර ඇති මතවාදද ඒ සඳහා දැක්විය හැකිය.සූත්‍ර පිටකයේද නිකාය වශයෙන් වර්ග කිරීමේදී හා එම නිකායන්හි අන්තර්ගතය පිළිබඳව විමසීමේදී එබඳු ලක්ෂණ දැකිය හැකිය. එහිදී විශේෂයෙන්ම දීඝනිකාය හා මජ්ඣිමනිකාය වර්ග කිරීම් පිළිබඳව උගතුන්ගේ විශේෂ අවධානයක් යොමු වී ඇති බව පෙනෙයි. සංයුත්ත නිකාය හා අංගුත්තර නිකායේ සූත්‍ර වර්ග කිරීම ක්‍රමවත්ය. එහෙත් අංගුත්තර නිකායේ අවශ්‍යයෙන්ම ඒ ඒ නිපාතයන්හි තිබිය යුතු කරුණු දක්නට නොමැති අවස්ථාද දක්නට ලැබේ. එසේම පුනරුක්ත බහුලය. ඛුද්දකනිකායේද එබඳු ලක්ෂණ දැකිය හැකිය. අභිධර්ම පිටකය පිළිබඳව විමසන විට, සම්ප්‍රදායන්හි හා උගතුන් අතර ඒකමතිකත්වයක් නොමැති බව



පැහැදිලිය. එයට හේතුව වන්නේ අභිධර්මය බුද්ධ භාෂිතයක්ද නොවේද යන්න පිළිබඳව වාද විවාද ඇති හෙයිනි. මෙහිලා අභිධර්මය පිළිබඳ අපගේ නිගමනය වන්නේ අභිධර්ම පිටකය වනාහි සූත්‍රපිටකයට අයත් දේශනාවන් පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක ප්‍රතිඵලයක් වශයෙන් පහළ වූවක් බවයි.[69]

## ආන්තික සටහන්

1. "පාලි ත්‍රිපිටක සාහිත්‍යය හා එහි සංවර්ධනය" උතුරාවල ධම්මරතන හිමි, **සම්භාෂා**, විද්‍යාලංකාර 125 වන සමරු සංග්‍රහය, 494 පිට.
2. "තදෙතං සබ්බම්පි බුද්ධවචනං රසවසෙන එකවිධං ධම්මවිනයවසෙන දුවිධං, පඨම මජ්ඣිම පච්ඡිමවසෙන තිවිධං, තථා පිටකවසෙන නිකායවසෙන පඤ්චවිධං අඞ්ගවසෙන නවවිධං, ධම්මක්ඛන්ධවසෙන චතුරාසීතිසහස්සවිධංන්ති වෙදිතබ්බො", **සුමඞ්ගලවිලාසිනිය**, හේවාවිතාරණ මුද්‍රණය, 1927, 11 පිට.
3. විමලවංස හිමි, බැද්දේගම, **බෞද්ධ සාහිත්‍යය**, අනුර මුද්‍රණාලය, මරදන, 1950, 1 පිට.
4. "උපාලිං විනයං පුච්ඡි - සුත්තන්තානන්ද පණ්ඩිතං පිටකං තීණි සංගීතිං - අකංසු ජිනසාවකා" **චුල්ලවග්ගපාලි**, පඤ්චසතිකක්ඛන්ධකය, බු.ජ.ත්‍රි, 2005, 564 පිට.
5. "පිටකං පිටකත්ථවිදූ - පරියත්ති භාජනතො ආහු තෙන සමොධානෙත්වා - තයොපි විනයාදයො ඤෙය්‍යා" **සුමඞ්ගල විලාසිනිය**, හේවාවිතාරණ මුද්‍රණය, 1927, 14. පිට.
6. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ,**පාලි සාහිත්‍යය**, රත්න පොත් ප්‍රකාශකයෝ, 2007, 20 පිට.
7. -එම- පි. 20.
8. K.R. Norman, *A History of Indian Literature,*1983, p 1.
9. "හන්ද මයං ආවුසො ධම්මං ච විනයං ච සඞ්ගායෙය්‍යාම, පුරෙ අධම්මො දිප්පති, ධම්මො පටිභාහීයති...." **සුමංගලවිලාසිනි නාම දීඝනිකායට්ඨකථා**, බු.ජ.ත්‍රි. 3 පිට.
10. **මජ්ඣිමනිකාය**, කකචූපම සූත්‍රය, බු.ජ.ත්‍රි. 2006, 312 පිට.
11. **අංගුත්තරනිකාය**, අට්ඨකනිපාතපාලි, වේරඤ්ජ සුත්තං, බු.ජ.ත්‍රි. 2005, 44 පිට.
12. **සුමඞ්ගලවිලාසිනිය**, හේවාවිතාරණ මුද්‍රණය, 1927, 8 පිට.

13. "විවිධවිසෙසනයත්තා - විනයනතො චෙව කායවචානං විනයත්ථ විදූ හි අයං - විනයො විනයො ති අක්ඛාතො" **සුමඞ්ගලවිලාසිනිය**, හේවාවිතාරණ මුද්‍රණය, 1927.
14. මෙහි භික්ඛු විභංග හා භික්ඛුනී විභංග යැයි කොටස් දෙකකි.
15. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, **පාලි සාහිත්‍යය**, රත්න පොත් ප්‍රකාශකයෝ, 2007, 111 පිට.
16. **සමන්තපාසාදිකා**, පඨම සංගීති කථා, හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණ, 1929, 10 පිට.
17. **සාරත්ථදීපනී ටීකා**, වෙරඤ්ජකණ්ඩ වණ්ණනා, හේවාවිතාරණ මුද්‍රණය, 1918, 6 පිට.
18. **සමන්තපාසාදිකා**, පඨම සංගීති කථා, හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණ, 1929, 10 පිට.
19. K.R Norman, *A History of Indian Lirerature,* Wiesbadan, 1983, p 42.
20. *Ibid.*, p. 42.
21. "සාධිකං භන්තෙ දියඩ්ඪ සික්ඛාපද සතං අන්වද්ධය මාසං උද්දෙසං ආගච්ඡති" **අංගුත්තරනිකාය**, නවකනිපාතය.
22. විනය පිටකයේ හැඩගැසීම, ගල්කැටිවල දේවානන්ද හිමි, **සාරද**, 1965, 72 පිට.
23. **පරිවාරපාලි**, බු.ජ.ත්‍රි., 2005, 187 පිට.
24. -එම- පි. 375.
25. විමලවංස ස්ථවිර, බැද්දේගම, **බෞද්ධ සාහිත්‍යය**, අනුර මුද්‍රණාලය, මරදන, 1950, 74 පිට.
26. K.R Norman, *A History of Indian Lirerature,* Wiesbadan, 1983, p 44.
27. **පාලි අධ්‍යයන විමර්ශන**, සංස්: මහමිතව පඤ්ඤරතන හිමි, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2009, 304 -305 පිටු.
28. "අත්ථානං සූචනතො සුවුත්තතො සවණතො සූදනතො සුත්තානා සුත්ත සභාගතොච සුත්තං සුත්තන්ති අක්ඛාතං" **සුමංගල විලාසිනිය**, හේවාවිතාරණ මුද්‍රණ, 1927, 13 පිට.
29. **පපඤ්චසූදනිය.**
30. **පාලි අධ්‍යයන විමර්ශන**, සංස්: මහමිතව පඤ්ඤරතන හිමි, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2009, 308 පිට.
31. **සුමංගලවිලාසිනිය**, හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණ, 1927, 8 පිට.



16 OCT 2017

32. "කථං නිකාය වසෙන පඤ්චවිධං? සබ්බමෙවහෙතං දීඝනිකායො මජ්ඣිමනිකායො සංයුත්තනිකායො අඞ්ගුත්තරනිකායො ඛුද්දකනිකායොති පඤ්චප්පභෙදං හොති." **සමන්තපාසාදිකා විනයට්ඨකථා**, සංස්: රඹුක්වැල්ලේ විපස්සි හිමි. සමයවර්ධන පොත්හල, කොළඹ, 2005, 69 පිට.
33. "දීඝස්ස දීඝසුත්තඞ්කිතස්ස නිපුනස්ස ආගමවරස්ස බුද්ධානුබුද්ධසඞ්වණ්ණිතස්ස සද්ධාවහගුණස්ස" **සුමඞ්ගලවිලාසිනිය**, හේවාවිතාරණ මුද්‍රණය, 1927, 1 පිට.
34. සූත්‍ර පිටකයේ ආකෘතිය, ගාමිණී පියපාල, **තරංග** අංක 8, ශ්‍රී ලංකා විද්‍යාල ශාස්ත්‍රීය සංග්‍රහය, 1963, 59 පිට.
35. "කථමො මජ්ඣිම නිකායො? මජ්ඣිමප්පමාණානි පඤ්චදසවග්ගසඞ්ගහානි මූලපරියායසුත්තාදීනි දියඩ්ඪසතං ද්වෙ ච සුත්තානි. **සමන්තපාසාදිකා විනයට්ඨකථා**, සංස්: රඹුක්වැල්ලේ විපස්සි හිමි. සමයවර්ධන පොත්හල, කොළඹ. 2005, 69 පිට.
36. "තතො අනන්තරං භාණවාරසත පරිමාණං සංයුත්තනිකායං සංගායිත්වා...." **සුමඞ්ගලවිලාසිනිය**, හේවාවිතාරණ මුද්‍රණය, 1927, 11. පිට.
37. **සංයුත්තනිකායට්ඨකථා** I, හේවාවිතාරණ මුද්‍රණය, 1938,1 පිට.
38. **පාලි අධ්‍යයන විමර්ශන**, සංස්: මහමිතව පඤ්ඤරතන, විජපේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2009. 155 පිට.
39. **සාරත්ථප්පකාසිනි**, හේවාවිතාරණ මුද්‍රණය, 1938.
40. "කතමො සංයුත්තනිකායො දෙවතා සංයුත්තාදිවසෙන ඨිතානි ඔඝතරණ සුත්තාදීනි සත්තසුත්තසහස්සානි සත්තසුත්තසතානි ච ද්වාසට්ඨී ච සුත්තානි. සත්තසුත්ත සහස්සානි සත්තසුත්ත සතානි ච ද්වාසට්ඨීචෙව සුත්තන්තා එසො සංයුත්තසංගහො." **(ස.පා.වි.අ., දී.අ., අ.අ.)**
41. Winternitz.M., *History of Indian Literature*. Vol. II, Calcutta, 1927, p. 56.
42. බුද්ධදත්ත, පොල්වත්තේ. **ත්‍රිපිටක සූචිය**, 1953. 67 පිට.
43. **පාලි අධ්‍යයන විමර්ශන**. සංස්: මහමිතව පඤ්ඤරතන, විජපේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2009. 160 පිට.
44. එම, 164 පිට.
45. එම, 165 පිට.
46. එම, 165 පිට.
47. Winternitz.M., *History of Indian Literature*. Vol. II, Calcutta, 1927, p. 58.

48. පාලි අධ්‍යයන විමර්ශන, සංස්: මහමිතව පඤ්ඤරතන, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2009. 162 පිට.

49. "නවසුත්ත සහස්සානි පඤ්ච සුත්ත සතානිච සත්තපණ්ණාස සුත්තානි සඞ්කා අංගුත්තරෙ අයං" **සුමඞ්ගලවිලාසිනිය**, හේවාවිතාරණ මුද්‍රණය, 1927, 11 පිට.

50. "ඨපෙත්වා චතුරොපෙතෙ නිකායෙ දීඝ ආදිකෙ තදඤ්ඤං බුද්ධවචනං නිකායො බුද්ධකො මතොති." **සමන්තපාසාදිකා විනයට්ඨකථා**, සංස්: රඹුක්වැල්ලේ විපස්සි හිමි. සමයවර්ධන පොත්හල, කොළඹ. 2005, 70 පිට.

51. "ද්වාසීතිං බුද්ධතොගණ්හි ද්වෙසහස්සානි භික්ඛුතො චතුරාසීති සහස්සානි යෙමෙ ධම්මා පවත්තිනො, **සුමංගලවිලාසිනිය**, හේවාවිතාරණ මුද්‍රණය, 1927, 19 පිට.

52. 'කෙනට්ඨෙන අභිධම්මො ධම්මාතිරෙක ධම්ම විසෙසට්ඨෙන අතිරෙක විසෙසත්ථ දීපකොහි එත්ථ අභි සද්දෙ' -එම- 2 පිට.

53. 'අභිධම්මොති සත්තපකරණානි, මග්ගඵලානි අභිධම්මො, **සුමංගලවිලාසිනි**, හේවාවිතාරණ සංස්කරණය, කොළඹ, 1918.

54. 'අභිධම්මොති විසිට්ඨෙ ධම්මෙ, ඉමෙසු සත්තතිංසබොධිපක්ඛියධම්මෙසූති අත්ථො,' **කින්ති සුත්තවණ්ණනා**.

55. අභිධම්ම පිටකයේ ප්‍රභවයට මාතිකා පදනම් වූයේද?, එච්.එම් මහින්ද හේරත්, **අභිනන්දන**, සංස්: නාරාවිල ධම්මදස්සි ආදිහු, 2007. 95 පිට.

56. "යො ඉමස්මිං ධම්මවිනයෙ අප්පමත්තො විහෙස්සති" **සංයුත්තනිකාය**, බ්‍රහ්මසංයුත්තය, අරුණවතී සූත්‍රය, 2004, 282 පිට. "තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති" **අංගුත්තරනිකාය**, තිකනිපාතය, භරණ්ඩුවග්ගය, නවම සූත්තං, 2005, 510 පිට."යො බො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො, සො බො මමච්චයෙන සත්ථා" **දීඝනිකාය**, පරිනිබ්බාණ සූත්‍රය, 242 පිට. "ධම්මං ච විනයං ච සංගායෙය්‍යාම" **චුල්ලවග්ගපාලි**, පඤ්චසතිකක්ඛන්ධකය, 2005, 546 පිට.

57. **බෞද්ධ අධ්‍යයන විමර්ශන**, සංස්. මහමිතව පඤ්ඤරතන, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 1 පිට.

58. "සම්මාසම්බුද්ධොව පඨමතරං අභිධම්මිකො, අභිධම්මෙ වාචනා මගෙගා පන සාරිපුත්තත්ථෙරප්පභවො." **අත්ථසාලිනි අටුවාව**, හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණ, 1940.

59. **දීඝනිකාය**, III, 2004, පි. 165.

60. අභිධර්ම යන වචනය මුල් බුදුසමයෙහි තිබුණත් එය සෑම විටම යෙදී ඇත්තේ අභිවිනය යන පදය සමඟිනි.



61. "හන්ද මයං ආවුසො ධම්මං ච විනයං ච සංගායෙය්‍යාම" **සමන්තපාසාදිකා**, පඨම සංගීති කථා, හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණය, 1929, 4 පිට.

62. **අත්ථසාලිනි අටුවාව**, හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණ, 1940, 23 පිට.

63. එම, පි. 13.

64. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, **පාලි සාහිත්‍යය**, රත්න පොත් ප්‍රකාශකයෝ, 2007, 117 පිට.

65. එම, 117 පිට.

66. Rhys Davids, *Buddhist India,* Sixth edition, Calcutta.P. 32.

67. Low, B, C., *The Magadhas in Ancient India,* London, 1946.p.45.

68. K.R Norman, *A History of Indian Lirerature,* Wiesbadan, 1983, p. 42.

69. මේ පිළිබඳ වැඩි විස්තර අධ්‍යයනය කිරීම සඳහා ආවර්ජනා ශාස්ත්‍රීය සංග්‍රහයේ අප විසින් ලියන ලද "අභිධර්මය" යන ලිපිය බලන්න. (ආවර්ජනා, 2016, පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සරසවි දහම් පාසලේ ප්‍රකාශනය)